# නිදහස් සන්ධානය රජයට අති විශිෂ්ට ජයක්!







මහින්ද රාජපක්ෂ මහතා ජනතා ජනපති වරයා People's President) යනුවෙන් බොහෝදෙනා විසින් හඳුන්වනු ලබන්නේ එතුමා සාමාන්‍ය ජනතාව දුටුවිට කිසි විටෙක ඔවුන් මගහැර නොයන නිසාය. විශේෂයෙන් සිය ගම් ප්‍රදේශ වල ජනයා හමුවූ විට ඔවුන් ගේ සුවදුක් විමසා බලමින් සුහදව කතාකර යන්නට අමතක නොකරන්නේය.

මේ ඡන්දය දිනයේ ජනපති වරයා සිය ඡන්දය ප්‍රකාශකර එද්දී තංගල්ලේදී හමුවූ පිරිසක් එතුමා වටකරගෙන සුබපැතූ ආකාරයයි.

## ජයග්‍රහණයේ මුහුණුවර

ශ්‍රීලංකාවේ 7 වෙනි පාර්ලිමේන්තුවට නියෝජිතයින් පත්කර ගැන්ම සඳහා පෙරේදා එනම් අප්‍රේල් 8 වනදා පැවති මහ මැතිවරණයෙන් එක්සත් ජනතා නිදහස් සන්ධානයට අති විශිෂ්ට ජයක් හිමිවූ බව දැන් ලොව බොහෝ දෙනා දනිති. එම ප්‍රථිඵල අනුව එක්සත් ජාතික පක්ෂයට **(UNP)** පාර්ලිමේන්තු ආසන 46 ක්ද, ප්‍රජාතන්ත්‍රවාදී ජාතික සන්ධානයට (සරත් ෆොන්සේකා **JVP** එකතුව) ආසන 5 ක්ද, ද්‍රවිඩ ජාතික සන්ධානයට ආසන 12 ක්ද හිමිව තිබේ. මහනුවර සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්ක දෙකේ ඡන්ද ප්‍රතිඵල නිකුත්කිරීම තවම කෙරී නැත්තේ මැතිවරණය දා එහි යම් අක්‍රමිකතා සිදුවූ බවට ලැබූ චෝදනා නිසාය. ඒ සඳහා යළි ඡන්ද විමසීමක් කෙරෙන බව කියති.

1978 දී ජේ. ආර්. ජයවර්ධන මහතාගේ රජය විසින් ගෙන එන ලද නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් කලින් ලංකාවේ තිබූ ඡන්ද ක්‍රමය අහෝසි කොට දිස්ත්‍රික්ක මට්ටමට අනුව සමානුපාතික ඡන්ද ක්‍රමයක් රටට හඳුන්වා දෙන ලදී. එතෙක් එක් පුද්ගලයෙකුට හිමිව තිබුණේ එක චන්දයක් පමණි. එහෙත් මෙම නව ක්‍රමය අනුව මනාප යනුවෙන් හඳුන්වා දෙන ලද ඡන්ද තුනක් භාවිතා කරන්නට එක් පුද්ගලයෙකුය හැකිකම ලැබේ. ලංකාවේ නොවන බොහෝ දෙනෙකුට මේ අළුත් ඡන්ද ක්‍රමය මහා අණ්ඩර දෙමළයක් වුවද, ශ්‍රීලංකාවේ ජනතාව කිසිදු අවුලකින් තොරව එතැන් පටන් වූ සෑම මැතිවරණයකදීම මෙම මනාප ක්‍රමයට අනුව ඡන්දය දීමේ කටයුතු කළහ.

ඕනෑම බලවේගයකට මුහුණ දිය හැකි ශක්තිමත් පාර්ලිමේන්තුවක් මෙන්ම, දශක තුනක සමානුපාත ඡන්ද ක්‍රමය යටතේ ලැබුණු විශිෂ්ටම ප්‍රථිඵලය ජනතාව විසින් රජයට ලබාදෙනු ඇතියි ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා මැතිවරණයට පෙර පැවසූ වදන් ඒ අපේක්ෂා කළ ආකාරයටම ඉටුවී ඇති බව පෙනෙන්නට තිබේ. රජය තුනෙන් දෙකක බලයක් කෙළින්ම ලැබේයයි සිතා සිටි නමුත් දැනට ඇති ප්‍රථිපල අනුව එයට සමීපව සිටින බවක් පෙනේ. ඉදිරි දිනවල සිදුවිය හැකි තත්වයන් මත තුනෙන් දෙකේ ප්‍රශ්නයත් නිරාකරණය වනු ඇතැයි ඇතැම් නිරීක්ෂකයෝ කියති.

## මේසා ජයග්‍රහණයකට හේතුව

මේ අනුව පැවසිය හැකි කාරණා බොහෝ ඇතත් ඉන් ප්‍රධාන හේතු පමණක් මෙහි සඳහන් කිරීම සෑහේ.

මූලිකම දේ වසර 30 ක් නිමකරන්නට නොහැකිව තිබූ කුරිරු ත්‍රස්තවාදී යුද්ධය රාජපක්ෂ රජය විසින් ඉතා ප්‍රශංසනීය අන්දමින් නිමවා රට සහ ජනතාව එම භයානක උවදුරෙන් මුදවා ගැනීමයි. ශ්‍රී ලංකාවේ ජනතාව කාලාන්තරයක් මුහුණ පා සිටි අවාසනාවන්ත අවිනිශ්චිත තත්වය දුරුකරන්නට සමත්වන කෙනෙකුට ජන තාවගේ ආදරය නිසැකවම හිමිවන බව කිව යුතු දෙයක් නොවේ. ජයග්‍රහණයට මූලික වශයෙන් බලපෑවේ ඒ කාරණායයි.

දෙවනුව යුද්ධය පැවති කාලයේ පවා මහින්ද රාපක්ෂ රජය පත්වූ විගස රටේ සංවර්ධන වැඩ රාශියක් ආරම්භ කළේය. මුලින් ඒ ගැන ජනතාවට අවබෝධයක් නැතිවුනත් පසුව පසුව ඒ වැඩකට යුතු මල්පල දරා රටට එළියක් වැටෙන විට සැබැවින්ම රට සංවර්ධනය කරා දිනෙන දින ළඟාවන බව කාටත් පෙනෙන්ට වීය. ගම්බදය, නගරබදය, දකුණ හෝ උතුර හෝ නැගණහිරයයි නොතකා නව මංමාවත් ඉදිවී, නව පාලම් තැනී, නව වරායවල් තැනී, නව ගුවන් තොටුපලවල් ඉදිවී රට සංවර්ධනයෙන් ඉහළට නැංවෙන බව ජනතාවට ඇස්පනාපිටම දකින්නට හැකිකම ලැබී ඇත.

ඊළඟට යුද්ධය නැවතීමද, නව වැඩපිළිවෙලවල් ක්‍රියාත්මකවීමද හේතු වෙන් ශ්‍රීලංකාවේ ආර්ථිකයද ස්ථාවර තත්වයකට පත්වෙමින් ඇත. මේ නිසා ඉතා පහතට වැටී තිබුණු සංචාරක ව්‍යාපාරය ඉහළ නගින්නට වීය. කලින් කිසිවෙකුට යා නොහැකිව තිබූ කොටි ත්‍රස්තවාදීන් පාලනය කළ උතුර හා නැගණහිර ප්‍රදේශ මුදාගැනීමන් පසු දැන් ඕනෑම කෙනෙකුට යාහැකි ලෙස ආරක්ෂා සහිත ප්‍රදේශ බවට පැමිණීම නිසා ජනතාව රිසිසේ ගමන්කරන අතර ඊට අවශ්‍ය ගමනාගමනයද කඩිනමින් රජය සකස්කර දී ඇත. එසේම අද ඕනෑම ආපදාවකට මුහුණදිය හැකි අයුරින් ත්‍රිවිධ හමුදාව සහ පොලීසියට ක්‍රියාත්මකවීමට ඇති හැකියාව ජනතාවගේ උදෝයෝගය මෙන්ම රජය කොරෙහි ඇති විශ්වාසය සහ ප්‍රසාදය දියුණු කරන්නක් වූයේය.

## විදේශ බලපෑම්වලට වර්තමාන රජය මුහුණදීම

ශ්‍රීලංකාවේ කොටි ත්‍රස්තවාදය අවසන්වූ බව සැබෑ නමුත් ලොවපුරා විවිධ රටවල සිටින කොටි නියෝජිතයන්ද කොටි හිතවාදී දෙමළ ඩයස්පෝරාවද විසින් කරනලද උද්ඝෝෂණ හා කියන බොරුවලට රැවටී එංගලන්තය ඇමරිකාව ඇතුළු සමහර රටවල් ශ්‍රීලංකාවට විවිධ චෝදනා එල්ලකරන්නට වූහ. ඇතැම් විදේශික මාධ්‍යයන් මඩ ප්‍රචාරයන් දියත් කළහ. මේ ක්‍රියාවන් තවමත් එසේම පවතී. එහෙත් ලංකා රජය මෙහිදී ඒ සෑම විදේශික රටකටම ඉතා පැහැදිලි ලෙස කීවේ ලංකාවේ කිසිම දේකට ඇඟිලි ගසන්නට ඉඩනොදෙන බවයි. බටහිර අධිරාජ්‍ය වාදීන් හමුවේ රාජපක්ෂ රජයේ මෙම කොන්ද නොනමන ස්ථිරසාර ගුණය ඉන් පෙර පැවති කිසිම ශ්‍රීලංකා රජයකින් ප්‍රකාශ නොවීය. මෙම කරුණද ජනතා වගේ පැහැදීමට හේතුවූවාට සැක නැත.

## මහින්ද චින්තනය ඉදිරි දැක්ම

ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගේ සංකල්පයක් වූ **මහින්ද චින්තනය ඉදිරි දැක්ම** රටේ සංවර්ධනය කෙරෙහි මූලිකව ම බලපාන දේශපාලන දර්ශනයක් බව දැන් බොහෝ ජනතාවගේ පිළිගැනීමයි. එම සංවර්ධන ක්‍රියාදාමය දිගටම කර ගෙන යාමට නම් මේ පවතින රජය තවත් වසර ගණනක් ඉදිරියට පැවතීම අවශ්‍ය වන්නේය. වෙනත් රජයක් පත්වුවහොත් මේ ක්‍රියාදාමයන් ඇනහිටින්නට හෝ අඩාලවන්නට හැකිය. මේ හේතුව නිසා ශ්‍රීලංකාවේ සෑම කොට්ඨාශයකම වෙසෙන බහුතර ජනතාවක් සන්ධාන රජයේ නියෝජිතයන් පාර්ලිමේන්තුවට පත්කර යැවීමට ගත් තීරණයක ප්‍රථිඵල අනුව ජනතාවගේ හදගැස්ම කොයි ආකාරදැයි ප්‍රකටව පෙන්නුම් කළේය. එම ජනවරම උතුරු නැගණහිර පවා පැහැදිලිව පෙනේ. දෙමළ සන්ධානයට එහි 2004 දී තිබූ සහයෝගය මේවර ඉතා පහතට බැස ඇති බවද දක්නට ඇත.

## එජාපයේ අවපාතය

එක්සත් ජාතික පක්ෂයට දිනාගත හැකිවී ඇත්තේ ආසන 46 ක් පමණි කොළඹ හැර අන් සියළුම දිස්ත්‍රික්කවල ඔව්හු විශාල පරාජයන් ලැබූහ. මෙයට මූලික හේතුව රනිල් වික්‍රමසිංහ මහතාගේ අතිශය දුර්වල නායකත්වය බව පාක්ෂිකයන් ඇතුළු බොහෝ දෙනාගේ මතයයි. ඔහුට රට ගැන කැක්කුමක් නැති බව පසුගිය කාලයේ ඔහු කළ ප්‍රකාශන වලින් පැහැදිලි විය. ඔහුගේ නායකත්වයෙන් යුත් රජය මගින් කොටි ත්‍රස්තවාදීන් සමග ගිවිසුමක් අත්සන් කළ බව අපි කවුරුත් දනිමු. යම් හෙයකින් ඔහු ඊට පසුවත් බලයේ සිටියේ නම් නිසැකවම කොටි ඔවුන් පැතූ ඊළම් රාජ්‍යය නිරායාසයෙන්ම ලබාගන්නා බව බොහෝදෙනාගේ එදා මෙන්ම දැනුත් මතයයි. යුද්ධය පැවති සමයේ විපක්ෂනායකයා ලෙස වුවද රනිල් සහ අනෙක් එජාප මන්ත්‍රීවරුන් යුද්ධය හෙළා දැක්ක හැටිත්, හමුදාපතිවරයා ඇතුළු සන්නද්ධ හමුදා අවඥාවට ලක් කළ අයුරුත් මතකය. මෙවර ඡන්දය භාවිතාකිරීමේ දී මේ කාරණා පාරම්පරික එජාප ඡන්දදායකයින් පවා ඡන්දය එජාපයට නොදෙන්නට හේතුවූ බව පෙනෙනෙන්ට තිබේ. පරාජයේ මූලිකම හේතුව රනිල් වික්‍රමසිංහ මහතාය යන මතයට හේතු මේ කාරණාය. එජාපය මේ අන්දමට පැවතුනහොත් එය මුළුමනින් විනාශවී යාහැකි බවත්, පුනර්ජීවයක් ලබන්නට නම් එයට අළුත් නායකයෙකු සහ රටේ තරුණ පෙළ පදනම් කරගත් ඉදිරි දැක්මක් අවශ්‍ය බවත් විද්වතුන්ගේ මතයයි.

## ජනතා විමුක්ති පෙරමුණේ අවාසනාවන්ත පිරිහීම

මෙවර මැතිවරණයෙන් පැහැදිලිවම පෙනෙන කරුණක් නම් මෙතෙක් ශ්‍රීලංකාවේ තරුණ බලවේගයක් ලෙස ජනතාව හඳුනාගෙන සිටි ජනතා විමුක්ති පෙරමුණ අන්ත පරාජයක් ලබා තිබීමයි එය මේ ආකාරයෙන් ගණනය කර පෙන්විය හැකිය.

1994 දී ජවිපෙ ජවිපෙ වශයෙන් මැතිවරණයකට මුහුණ දුන් අවස්ථාවේ එක් ආසනයක් ලබාගැන්මට සමත්විය. 2000 දී පැවති මැතිවරණයෙන් ජවිපෙ ආසන 9 ක් ලබාගත්තේය. 2001 දී ඔවුනට ආසන 16 ක් ලැබිණ. 2005 දී ජවිපෙ සන්ධානයක් ලෙස චන්ද්‍රිකා රජය හා එක්ව ආසන 39 ක් ලබාගන්නට සමත්වූයේය. මහින්ද රාජපක්ෂ මහතා අගමැතිවූයේද ඒ මැතිවරණයේදීය. එහෙත් මෙවර මැතිවරණයෙන් ජනතා විමුක්ති පෙරමුණ ඉතා අවාසනාවන්ත ඉරණමකට ගොදුරු වෙමින් ලබාගෙන ඇත්තේ ආසන 5 ක් පමණකි.

මේ පරාජයට මූලික හේතුව පක්ෂයක් ලෙස ඔවුන් ගත් වැරදි තීරණයන් බව පෙනේ. මුලින් රජයට පක්ෂව සිටි ඔවුන් ජනපතිවරණයේ සිටම ජෙනරාල් පොන්සේකා සමග එක්වී රජය විවේචනය කරන්නට වීම සහ කොටි ත්‍රස්තවාදීන්ගේ හිතවතුන්ව සිටි දෙමළ සන්ධානය සහ එක්වීමද ජනතාවගේ නොමනාපයට හේතුවිය. මේ අතරේ ජවිපෙ ප්‍රබලයෙකුව සිටි විමල් වීරවංශ මහතා කැඩීයාමද සෑහෙන හානියක් වූයේය. එසේම ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ මහතා වේදිකාවල ඉතා ආවේග ශීලීව රජයට හා රටේ නායකයාට බැන වැදීම ද ජවිපෙ කෙරෙහි පාක්ෂිකයන් පවා කළකිරවීමට හේතු වූයේය. ඔවුන් හා සිටි තරුණ පෙළ දැන් ඔවුන් අතහැර ගොස් සිටිති. මේ බිඳවැටුණු ජනතා විශ්වාසය යළි කිසිදාක ජනතා විමුක්ති පෙරමුණට ගොඩ නගා ගත හැකිවේයයි සිතන්නට බැරිය.

මෙම පැවැත්වූ මැතිවරණයත්, ඉන් ලද සුබදායක ප්‍රථිපලත් අප රට අනාගත අභිවෘද්ධිය කරායන මාවතට යොමුකිරීමක් ලෙස සිතනු වටී. මෙවර ප්‍රථමවරට ආ තරුණ පිරිසක් මන්ත්‍රීවරු ලෙස රජයෙන්ද විපක්ෂයෙන්ද තේරී පත්වී සිටිති. අනාගතයේ යහපත් දේශයක් බිහිකිරීම ඒ කාගේත් වගකීමයි. ශ්‍රීලංකාව සුබ අනාගතයක් කරා ගෙනයන්නට පක්ෂ භේදයකින් තොරව කවුරුත් සිතට ගන්නවා ඇතැයි සිතමු.

සැමට සුබ අනාගතයක් !
සුබ අළුත් අවුරුද්දක් වේවා !

♦ **සංජය**



## විශාඛා ආදිකතුවරිය ගුණ සමරති

පසුගිය මාර්තු 28 වෙනි දින එක්සත් රාජධානියේ වෙසෙන කොළඹ විශාඛා විද්‍යාලයේ ආදි ශිෂ්‍යාවෝ එක්ව ලන්ඩන් බෞද්ධ විහාරයේ මල් පහන් පූජාවක් පවත්වා එම විදුහලේ ආදිකතුවරිය වන ජෙරමියස් දියෙස් මැතිණිය සිහිපත් කළෝය. ඉන් අනතුරුව ආදිශිෂ්‍ය සංගමයේ සභාපතිනිය වන ඉන්ද්‍රමාලා ධනරත්න මහත්මිය ආදිකතුවරියගෙන් වූ සේවය පහදා දෙන්නට රුකී ෂිලාම් මහත්මියට ආරාධනා කළාය. ලන්ඩන් විහාරයේ ස්වාමීන් වහන්සේලාගේ අනුශාසනාවකින් පසු පිරිස පැන්වඩා සිය ආදිකතුවරියට පින් අනුමෝදන් කළහ. මේ කටයුත්තට විශාඛා ආදි ශිෂ්‍යාවෝ රාශියක් සහ භාගිවූහ. විශාඛා ආදි ශිෂ්‍ය සංගමය සිය විදුහලට මෙන්ම ශ්‍රීලංකාවේ විවිධ පුණ්‍ය කටයුතු සඳහා ආධාර කරති.